**නිවේදනයයි**

**කැළණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවන්ට සිදුකල පහරදීම හා අත්අඩංගුවට ගැනීමට එරෙහිව**

කැළණිය විශ්ව විද්‍යාලයේ සිසුන් දෙපිරිසක් අතර 2009 පෙබරවාරි 5 වන දින ඇති වූ ගැටුම පාලනය කිරීමට පැමිණි පොලිස් නිළධාරීන් එහිදී ක්‍රියාකල ආකාරය පිළිබඳව ස්ත්‍රී සංවිධානයක් හැටියට අපගේ බලවත් අප්‍රසාදය මෙයින් පලකර සිටිමු.

එහිදී ශිෂ්‍යාවන් අත්අඩංගුවට ගත් ආකාරයත්, ඔවුන්ව බලහත්කාරයෙන් ඇදගෙන විත් ජීප් රථවලට දමාගත් ආකාරයත්, ඔවුන්ට නින්දා වන ආකාරයෙන් වචන භාවිතා කළ ආකාරයත් දුටු අපගේ සිතට නැගුණු පැනය නම්, රටේ නීතිය හා ආරක්ෂාව භාරව කටයුතු කරන පොලිසිය කෙරෙහි, මේ රටේ ස්ත්‍රීන් වන අපට තවදුරටත් විශ්වාසයක් තැබිය හැක්කේ කෙසේද යන්නයි.

පොලිසිය කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසයට, ගරුත්වයට හානි නොවන අයුරින් මෙයට වඩා සදාචාරාත්මක නීතිගරුකව මෙවැනි ප්‍රශ්න වලට මැදිහත් වීමට හැකිව තිබියදීත්, ප්‍රසිද්ධියේ මහමඟ මෙම ශිෂ්‍යාවන්ට පහර දෙමින් කාන්තා පොලිස් නිළධාරිනියක් පවා නොමැතිව සිදුකල මෙම අත්අඩංගුවට ගැනීම් අප කිසිසේත් අනුමත නොකරමු.

සියළු ගැටළු වලට විසඳුම් ප්‍රචණ්ඩකාරීව සෙවීමට පෙළඹී ඇති වතාවරණයක් තුළ අපට ආරක්ෂාව සපයන නීතිය ක්‍රියාත්මක කරන පොලිසිය ද මෙලස ප්‍රචණ්ඩ අයුරින් හැසිරීම, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන මේ රටේ ස්ත්‍රී පුරුවැසියන් හැටියට අපි තරයේ හෙළා දකිමු.

ස්ත්‍රීන්ට අවමන් වන අකාරයේ මෙවැනි ක්‍රියා ඉදිරියේ දී සිදුවීම වැළැක්වීමටත්, පොලිසියේ හැසිරීම මීට වඩා විනයගරුක අයුරින් පවත්වා ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල බලධාරීන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
2009 පෙබරවාරි 11 දින